**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් සියලු වත්කම් මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.73,583,056 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවලින් පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවලින් කොටසක් එහි පිරිවැයටත් තවත් කොටසක් එහි ප්‍රත්‍යාගණන අගයටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මණ්ඩලයට අයත් සියලුම ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට සැළසුම් කර තිබුණු බව, මේ සම්බන්ධව කඩිනමින් නිලධාරියෙකුගේ සේවය ලබා දෙන මෙන් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇති බව, පවතින කොවිඩ් 19 වසංගතය හේතු කොටගෙන ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සම්පූර්ණ කළ නොහැකි වූ බව හා එම දෙපාර්තමේන්තුවේ සේවය ලබා ගැනීමෙන් පසුව කඩිනමින් ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ගිණුම් සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව කටයුතු කර සියළුම ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.184,019,059 ක් වූ වත්කම් වල ඵලදායී | ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හා 7 ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් භාවිතා කරනු ලබන වත්කම් |

| | | | |
|---|---|---|---|
| | ජීවකාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | | සම්බන්ධව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව, විශ්‍රාම ප්‍රතිලාභ වගකීම වට්ටම් ක්‍රමය මත අගය කර නොතිබුණු අතර එම වගකීම රු.61,566,421 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණි. | ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව කටයුතු කර වරද නිවැරදි කරමින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 96 ඡේදය ප්‍රකාරව, 2020 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබුණු පිරිවැය රු.928,085 ක් වූ මෘදුකාංගවල ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කර වාර්ෂික ක්ෂය කපා හැර නොතිබුණි. | ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ප්‍රකාරව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ප්‍රකාරව කටයුතු කර වරද නිවැරදි කරමින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වන විට නවදිගන්තය පුනරුථාපන මධ්‍යස්ථානය තුළ දානපතියෙකු විසින් ඉදිකර තිබුණු නව ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | පරිත්‍යාගයන් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | | |
| (අ) | දේපළ, පිරියත හා උපකරණ | 761.85 | 769.29 | 7.44 | වෙනස්කම් වලට හේතු කඩිනමින් සොයා බලා ඉදිරියේදී විගණනයට වාර්තා කිරීමට කටයුතු කරන | වෙනස්කම් වලට හේතු කඩිනමින් සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකරමින් ඊළඟ වර්ෂයේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමුච්චිත ක්ෂය වෙන්කිරීම | 258.04 | 266.79 | 8.75 | වෙනස්කම් වලට හේතු කඩිනමින් සොයා බලා ඉදිරියේදී විගණනයට වාර්තා කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු කඩිනමින් සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකරමින් ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබුණු කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | වර්ෂ | | |
| අවිනිශ්චිත ගිණුම | 480,900 | 07 | 2021 මාර්තු 03 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ලද උපදෙස් මත එම ශේෂය නිරවුල් කිරීම සඳහා කමිටුවක් පත්කර අදාළ ශේෂ නිරවුල් කරමින් පවතින බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හැකි ඉක්මනින් නිරවුල් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති හර ශේෂය රු.1,782,060 ක් වර්ෂ 20 කට වැඩි කාලයක සිට චලනය නොවී පැවති අතර එම ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | අත්තිකාරම් ගිණුම් ශේෂය ඉතා පැරණි ශේෂයක් වන බැවින් හඳුනා ගත නොහැකි බව හා 2021 මාර්තු 03 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ලද උපදෙස් මත එම ශේෂය නිරවුල් කිරීම සඳහා කමිටුවක් පත්කර අදාළ ශේෂ නිරවුල් කරමින් පවතින බව. | අත්තිකාරම් ගිණුම් ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 7 වන වගන්තිය | තුලනීක්ෂණ මූල මණ්ඩලය පත්කර නොතිබුණි. | 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව, ප්‍රායෝගික ගැටළු හේතුවෙන් පනතෙහි 7 වන වගන්තිය ප්‍රකාරව තුලණීක්ෂණ මූල මණ්ඩලය පත් නොකළ බව හා එම ගැටළු මඟහරවා ගනිමින් සංශෝධිත පනත් කෙටුම්පත සකස් කර කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත 2021 මැයි 10 දින ඉදිරිපත් කළ බව. | තුලණීක්ෂණ මූල මණ්ඩලය පත්කර නොතිබුණු බැවින් පුනරුත්තාපනයට ලක්වන සේවාලාභීන්ගේ ඖෂධවලට ඇබ්බැහිවීමේ මට්ටම, නැවත යොමුවීමට ඇති ප්‍රවණතාවය, ශාරීරික සහ මානසික මට්ටම, පවුල් පසුබිම හා සමාජීය පසුබිම ආදී ඉතා වැදගත් කරුණු පිළිබඳ ඇගයීමක් සිදු නොවන බැවින් පුනරුත්තාපන ක්‍රියාවලියෙන් ලබා ගත හැකි උපරිම ඵලදායීතාවය ලඟාකර ගැනීම සඳහා තුලනීක්ෂණ මූල මණ්ඩලය හැකි ඉක්මනින් පත්කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 381 | රාජකාරි බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණු ජංගම ගිණුම ආරම්භ කිරීම සඳහා එවැනි ඉල්ලීමක් කර නොතිබුණි. | මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවූවන්ගේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා විවිධ පාර්ශවයන්ගෙන් මූල්‍ය ආධාර ලැබුණු බව, ඒවා තැන්පත් කිරීම සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කළ බව හා විගණන නිරීක්ෂණයේ සඳහන් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 395 (ඉ) | බැංකු සැසඳුම් පිළියෙල කිරීම සහ මුදල් පොත පවත්වාගෙන යාම ස්වාධීන නිලධාරීන් දෙදෙනකු විසින් සිදුකළ යුතු වුවත් එම කාර්යයන් දෙක එක් නිලධාරියෙකු විසින් සිදුකර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟවන බව, වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිසි අභ්‍යන්තර පාලනයක් ඇති වන පරිදි වැඩ පැවරීම සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 12,697,277 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 38,259,643 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,562,366 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු.26,757,210 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 මැයි 12 දිනැති අංක 1653/ 19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, යම් තැනැත්තකු විසින් ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්තාපනය සඳහා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යයි නම් ඔහු විසින් අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නිකුත් කරන බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වුවද, 2021 ජූලි මාසය වන විට බලපත්‍ර කල් ඉකුත්වී තිබුණු පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 14 ක් විය. 2019, 2020 හා 2021 ජූලි මාසය දක්වා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද අදායම පිළිවෙලින් රු.17,000, රු.13,500 හා රු. 2,000 ක් වූ බැවින් බලපත්‍ර අලුත් කිරීම ක්‍රම ක්‍රමයෙන් අඩුවී ඇති බවද නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිසි නියාමනයක් සිදුකර නොතිබුණි. | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නියාමනය කිරීමේදී ඇති වන ප්‍රායෝගික ගැටළු හඳුනාගෙන සුදුසු පරිදි 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නියාමනය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්තාපනය සඳහා පිහිටුවා ඇති පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක් මණ්ඩලයේ සෘජු විමර්ෂණය යටතේ පවතින නමුත් එම සියලුම ප්‍රතිකාර මධ්‍යස්ථාන විමර්ෂණ කිරීම සඳහා විමර්ෂන නිලධාරීන් තිදෙනෙකු පමණක් සේවයේ යොදවා | විමර්ෂණ නිලධාරී තුනතුරු 03 ක් පමණක් අනුමතවී ඇති බව, එක් විමර්ෂණ නිලධාරියෙකු 2020 ජූලි 15 දින විශ්‍රම ගිය බව හා එම පුරප්පාඩුව කඩිනමින් පිරවිය යුතු බව, ඉදිරියේදී අවශ්‍ය කාර්ය | නිසි අධ්‍යනයකින් පසුව අවශ්‍ය විමර්ෂණ නිලධාරීන් ප්‍රමාණය තීරණය කර සේවක |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. තවද ප්‍රතිකාර හා විමර්ෂණ නිලධාරී තනතුරු දෙකක් කාලයක් පුරා පුරප්පාඩු වී පැවතුණි. නිසි පරිදි බඳවාගත් ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් මගින් නිසි සැලැස්මකට අනුව විමර්ශන කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ප්‍රතිකාර මධ්‍යස්ථානවල අඩුපාඩු සහ දුර්වලතා රාශියක් පවතින බව විමර්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. | මණ්ඩලය අනුමත කර ගත යුතුව ඇති බව හා දැනට පවතින නිලධාරී හිඟය මඟහරවා ගෙන විධිමත් සැලැස්මකට අනුව පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නිරීක්ෂණය සඳහා දිස්ත්‍රික් සහ පලාත් මට්ටමින් සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන් 22 දෙදෙනෙකුගේ සහයෝගය ලබාගන්නා බව. | සංඛ්‍යාවට ඇතුළත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) | දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයන් නැවත නැවත ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානයන්හි සේවය ලබාගැනීමේ ප්‍රවනතාවයක් පැවති බව නිරීක්ෂණය වූ අතර මණ්ඩලයට අයත් නිට්ටඹුව, මහනුවර, ගාල්ල සහ තලංගම යන ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථාන වල ප්‍රතිකාර කාලය අවසන් කළ සේවාලාභීන් 157 දෙනෙකු 2020 වර්ෂය තුළ නැවත ප්‍රතිකාර සඳහා මධ්‍යස්ථාන වෙත පැමිණ තිබුණි. | සේවාලාභීන් පිළිබඳ පසු විපරම් හා ඇගයීම් ක්‍රමවේදය ඉදිරියේදී වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | පසුවිපරම් ක්‍රියාවලිය ඉතා හොඳින් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අප්‍රේල් 30 දින රු.4,027,518 ක් වැයකර තිස් අවුරුදු බදු පදනම මත හෝමාගම පිහිටි පර්චස් 40ක ඉඩම මිලදී ගෙන තිබුණු නමුත්, 2021 සැප්තැම්බර් 01 දින වන විටත් එය ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අපේක්ෂිත කාර්යය මේ දක්වා ඉටු කර ගත නොහැකි වූ බව හා මේ සඳහා විසඳුමක් ලෙස පෙර නිමි ගොඩනැගිල්ලක් (Pre Fab Building) ලබාදීමට කටයුතු කරන බව ආරක්ෂක අමාත්‍යාංශ විසින් 2021 පෙබරවාරි 08 දින දන්වා ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජූලි 01 දිනට අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 33 කට සමාන පුරප්පාඩු තනතුරු 125 ක් පැවති අතර අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 67 කට සමාන කාර්ය මණ්ඩලයකින් මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම තුළ, මණ්ඩලයේ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන පිළියෙල කර තිබුණු අනවශ්‍ය කාර්යමණ්ඩලයක් සඳහා අනුමැතිය ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | සේවක සංඛ්‍යාව නැවත සමාලෝචනය කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව හා පෙන්වාදී ඇති අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිසි අධ්‍යනයකින් පසුව අනුමත කාර්යමණ්ඩලය සුදුසු පරිදි සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධ්‍යක්ෂ (පරිපාලන), අධ්‍යක්ෂ (පර්යේෂණ) හා අධ්‍යක්ෂ (ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිර සේවා) යන තනතුරු 2013 වර්ෂයේ සිටද අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2017 වසරේ සිටද පුරප්පාඩුවී පැවතුණි. මණ්ඩලයේ ඉහළ කළමණාකරණ තනතුරු දීර්ඝකාලයක සිට පුරප්පාඩුව පැවතීම, මණ්ඩලය පිහිටුවීමේ අරමුණු නිසි ලෙස ඉටුකර ගැනීමට නොහැකිවීම සඳහා සෘජුවම බලපාන බව නිරීක්ෂණය විය. | 2020 ඔක්තෝබර් 23 දින පුවත්පත් දැන්වීම් හා ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවූ නමුත් අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැති බව හා මෙම පුරප්පාඩු තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත් කර ඇති බව. | මෙවැනි අත්‍යවශ්‍ය තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය. |